**විශේෂ සටහන 22**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග - 2007 [1/]

### මූර්ත අංශය

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 04 | - | 2003 දී හඳුන්වා දෙනු ලැබූ රාජ්‍ය සේවකයන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසිකර ඒ වෙනුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකත්වය පිරිනමන ලදී. |
| 2007 අප්‍රේල් 24 | - | දෙවන ජාතික ගුවන් සේවය ලෙස රජයේ පූර්ණ හිමිකාරිත්වය ඇතිව මිහින් ලංකා (පෞද්.) සමාගම සිය කටයුතු ආරම්භ කරන ලදී. |
| 2007 අප්‍රේල් 27 | - | තැපැල් ගාස්තු සංශෝධනය කරන ලදී. |
| 2007 ජූලි 01 | - | මගී බස් ගාස්තු සියයට 17.5 කින් පමණ ඉහළ දමන ලදී. |
| 2007 නොවැම්බර් 01 | - | මාසික ස්ථාවර ගාස්තුව ඇතුළුව ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන ගාස්තු සංශෝධනය කරන ලදී. |
| 2008 පෙබරවාරි 01 | - | මගී බස් ගාස්තු සියයට 4.6 කින් පමණ ඉහළ දමන ලදී. |
| 2008 මාර්තු | - | විදුලිබල ගාස්තුව සියයට 30 කින් පමණ ඉහළ දමන ලදී. |

### විදේශීය අංශය

**වෙළෙඳ හා තීරු බදු**

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 31 | - | කරවල, උම්බලකඩ, ලොකු ළූනු, රතු ළූනු, කඩල, මුංඇට, කව්පි සහ වියළි මිරිස් වැනි තෝරාගත් ආහාර ද්‍රව්‍ය ආනයනයේ දී ලබාදී තිබූ පූර්ණ බදු අත්හැරීම 2007 පෙබරවාරි 15 දින තෙක් දීර්ඝ කරන ලදී. |
| 2007 පෙබරවාරි 02 | - | පෙට්‍රල් ආනයනය මත වන තීරු බද්ද ලීටරයකට රුපියල් 5.00 සිට රුපියල් 20.00 දක්වා ඉහළ දමන ලදී. |
| 2007 පෙබරවාරි 14 | - | පෙට්‍රල් ආනයනයේ දී ලීටරයකට රුපියල් 15.00 ක තීරු බදු අත්හැරීමක් මාසයක කාලයක් සඳහා ලබා දෙන ලදී. |
| 2007 මාර්තු 10 | - | මෝර කරවල, උම්බලකඩ, හාල්මැස්සන්, කඩල, මුංඇට, වියළි මිරිස්, පිළියෙළ කරන ලද හෝ කල්තබාගන්නා ආකාරයට සැකසූ මාළු වැනි තෝරාගත් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා ලබාදුන් පූර්ණ තීරු බදු අත්හැරීම තවදුරටත් දීර්ඝ කරන ලද අතර, ලොකු ළූනු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.00 ක බදු අත්හැරීමක් ද 2007 අප්‍රේල් 30 දක්වා ලබාදෙන ලදී. |
| 2007 මාර්තු 29 | - | අර්තාපල් ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 5.00 ක තීරු බදු අත්හැරීමක් 2007 අප්‍රේල් 30 දක්වා ලබා දෙන ලදී. |
| 2007 අප්‍රේල් 17 | - | පෙට්‍රල් ආනයනයේ දී ලබාදෙන බදු අත්හැරීම ලීටරයකට රුපියල් 15.00 සිට රුපියල් 20.00 දක්වා පූර්ණ බදු අත්හැරීමක් ලෙස ඉහළ නංවන ලදී. |
| 2007 අප්‍රේල් 25 | - | තෝරාගත් රජයේ සේවකයන් සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ සහනදායී තීරුබදු මත වාහන ආනයනය සඳහා අවසර දෙන ලදී. |

[1/] 2007 වසර තුළදී සහ 2008 වසරේ මුල්මාස තුන තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම 2008 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ගද ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2007 ජුනි 01 | - | මෝර කරවල, උම්බලකඩ, හාල්මැස්සන්, කඩල, මුං ඇට, වියළි මිරිස් වැනි තෝරාගත් ආහාර ද්‍රව්‍ය ආනයනයේ දී ලබා දුන් පූර්ණ බදු අත්හැරීම 2007 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී. |
| | - | අර්තාපල් සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 5.00 ක් ද, ලොකු ළූනු සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.00 ක් ද, උක් සීනි, බීට් සීනි, වෙනත් සීනි හා සක්කර සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 2.00 ක් ද, සුදු ස්ඵටිකෘත උක් සීනි හා සුදු ස්ඵටිකෘත බීට් සීනි සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 3.00 ක් ද ලෙස තීරු බදු අත්හැරීම් ලබා දෙන ලදී. |
| 2007 අගෝස්තු 01 | - | තෝරාගත් අළුත් මාළු වර්ග කිහිපයක් ආනයනය කිරීමේදී පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| | - | කොප්පරා ආනයනය මත වූ තීරුබද්ද 2008 පෙබරවාරි 29 දින දක්වා ඉවත් කරන ලදී. |
| | - | ආහාරයට ගන්නා තෙල් වර්ග ආනයනයේ දී මාසයක කාලයක් සඳහා සියයට 10 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| | - | බීට් සීනි සහ හකුරු ආනයනයේ දී කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.50 ක බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| | - | තෝරාගත් ආහාර ද්‍රව්‍ය දහයක් සඳහා ආනයන තීරු බද්ද, එකතු කළ අගය මත බද්ද, සමාජ වගකීම් බද්ද, සෙස් බද්ද, වරාය හා ගුවන් සේවා සංවර්ධන ගාස්තු හා වෙනත් රේගු ගාස්තු ආදිය වෙනුවට ඒකාබද්ධ විශේෂිත තීරු බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2007 අගෝස්තු 15 | - | 2007 දෙසැම්බර් 31 දින දක්වා බල පැවැත්වෙන පරිදි ලොකු ළූනු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 5.00 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී. |
| 2007 අගෝස්තු 20 | - | 2007 ඔක්තෝබර් 31 දින දක්වා බලපැවැත්වෙන පරිදි අර්තාපල් ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 5 ක තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී. |
| 2007 සැප්තැම්බර් 13 | - | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ව්‍යාපෘති සඳහා වන අයිතමයන් ආනයනය කිරීම/ දේශීයව මිල දී ගැනීම තීරු බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2007 ඔක්තෝබර් 15 | - | අර්ධ වශයෙන් නිවුඩු ඉවත්කරන ලද සහල් හෝ සම්පූර්ණයෙන්ම නිවුඩු ඉවත් කරන ලද සහල් සහ කැඩුණු සහල් ආනයනයේ දී පූර්ණ තීරු බදු අත්හැරීමක් 2007 දෙසැම්බර් 31 දක්වා ලබාදෙන ලදී. |
| 2007 නොවැම්බර් 08 | - | විදුලි පරිපථ චාප ලාම්පු සහ චාප ලාම්පු කාබන් ආනයනය කිරීම තීරු බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචි කිරීම ආනයන තීරු ගාස්තු හා වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන ගාස්තු වලින් නිදහස් කරන ලදී. |
| 2007 දෙසැම්බර් | - | ආහාරයට ගන්නා තෙල් වර්ග හැර අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයේදී ලබාදී තිබූ තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. |
| 2007 ජනවාරි 09 | - | අත්‍යවශ්‍ය ආහාර ආනයනයේදී අයකරන ලද තීරු බදු, එකතු කළ අගය මත බදු, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන ගාස්තු, සමාජ වගකීම් බද්ද සහ අනෙකුත් රේගු ගාස්තු වෙනුවට ඒකාබද්ධ විශේෂිත තීරු බද්දක් මාස 4 ක කාලයක් සඳහා හඳුන්වා දෙන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 01 | - | විදේශ මුදල් හුවමාරු කරන්නන්ගේ බලපත්‍රය දීර්ඝ කිරීම සඳහා අදාළ වන වාර්ෂික සාමාන්‍ය පිරිවැටුම එ.ජ.ඩොලර් 120,000 සිට එ.ජ.ඩොලර් 600,000 දක්වා ඉහළ දමන ලදී. |

| | | |
|---|---|---|
| | - | බලපත්‍ර සහිත මුදල් හුවමාරුකරන්නන් හට සංචාරක චෙක්පත් මුදල් කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. |
| 2007 ජනවාරි 08 | - | ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම්කරනු ලබන ශ්‍රී ලංකාව හැර ගිය අය / විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන් සඳහා දේශීය බැංකු ඒකකයන් හි විදේශ ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක් හඳුන්වාදෙන ලදී. |
| 2007 ජනවාරි 22 | - | දේශීය මුදලින් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන ඔවුන් විසින් තබාගත යුතු අවම කාලසීමාව ඉවත් කරන ලදී. |
| 2007 මාර්තු 19 | - | නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය යටතේ වීසා බලපත්‍ර ලබාගන්නා විදේශිකයන් සඳහා නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCA) සහ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් (RGRCA) යන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වර්ග දෙක හඳුන්වා දෙන ලදී. |
| 2007 ජූනි 14 | - | ජාත්‍යන්තර ගනුදෙනු පහසු කිරීමේ අරමුණින් විදේශීය රටවල සංචාරය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සඳහා දෙනු ලබන සංචාරක දීමනාවෙහි කොටසක් ලෙස නිකුත් කරන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම එ.ජ.ඩොලර් 500 සිට එ.ජ.ඩොලර් 1,000 දක්වා හෝ වෙනත් ව්‍යවහාර මුදල් වලින් ඊට සමාන ප්‍රමාණයක් දක්වා වැඩිකරන ලදී. |
| 2007 ජූනි 15 | - | අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ඇරඹීම හා පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දී තිබූ විශේෂිත බැංකුවලට හා නියෝජිතයන්ට, එම ගිණුම් හිමියන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් විසින් බැර කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ඍජුව ලබාගැනීමට අවසර ලබාදෙන ලදී. එම ගිණුම් හිමියන්ගේ ගිණුම්වලට එවැනි පවුලේ සාමාජිකයකු විසින් වරක දී බැර කරන මුදල් ප්‍රමාණය එ.ජ.ඩොලර් 1,000 හෝ ඊට සමාන වටිනාකමක් ඇති විදේශ ව්‍යාවහාර මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය. |
| 2007 ජූලි 05 | - | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4 ක් හෝ ඒ හා සමාන වටිනාකම ඇති අනිකුත් විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක වාර්ෂික විදේශ විනිමය ගණුදෙනු (බලයලත් ගණුදෙනුකරුවන් වෙත ඇති තැන්පත් ප්‍රමාණය) සිදුකරනු ලබන බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්ට එක් ගණුදෙනුවක වටිනාකම එ.ජ.ඩොලර් 1,000 ක සීමාවකට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සඳහා අවසර ලබාදෙන ලදී. කෙසේ වෙතත්, වාර්ෂික ගනුදෙනු එ.ජ.ඩොලර් දශලක්ෂ 4 ක ප්‍රමාණයේ පවත්වාගෙනයාමට අපොහොසත් වන්නේ නම්, විදේශ මුදල් විකිණීම සඳහා ලබාදී ඇති අවසරය අත්හිටුවන ලදී. |
| 2007 සැප්තැම්බර් 27 | - | විදේශ ව්‍යවහාර මුදල් සීමාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කළයුතු සීමාව අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකුට ගෙන ආ හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය එ. ජ. ඩොලර් 10,000 ක් හෝ වෙනත් පරිවර්තය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන වූ අගයක සිට ඇ. එ. ජ. ඩොලර් 15,000 ක් හෝ වෙනත් පරිවත්‍ය විදේශ ව්‍යාහාර මුදල් වර්ගයකින් ඒ හා සමාන වූ අගයක් දක්වා වැඩිකරන ලදී. |
| 2007 දෙසැම්බර් 06 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කළ විදේශ රටවල අරමුදල්, ප්‍රාදේශීය අරමුදල් හා සහයෝගිතා අරමුදල්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ ආයතන හා විදේශ රටවල පුරවැසියන්ට භාණ්ඩාගාර බැඳුම්කර වල මුළු වටිනාකමින් සියයට 10 ක් නොඉක්මවන පරිදි, රුපියල් වලින් මිල කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කිරීමට අවසර ලබාදෙන ලදී. |

**අපේක්ෂිත**

| | | |
|---|---|---|
| 2008 | - | මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් සඳහා නව විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හඳුන්වා දීම. |

- ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග හඳුන්වාදීම සඳහා පවතින විනිමය පාලන පනත විමර්ශනය කිරීම.
- 2008 අයවැය යෝජනාවලට අනුව පෞද්ගලික අංශයට විදේශ ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් ණය ලබාගැනීම සඳහා අවසර ලබාදෙමින් බලයලත් වෙළෙඳුන්හට නව මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.

## රාජ්‍ය මූල්‍ය අංශය

**රජයේ ආදායම**

2007 ජනවාරි 01

- එකතු කළ අගය මත බදු අය කරනු ලබන පිරිවැටුම් සීමාව වූ වසරකට රුපියල් දශ ලක්ෂ 1.8 සීමාව ආසන්නයේ සැපයුමක් ඇති ඕනෑම පුද්ගලයකු එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී නොමැති නම් සිය කැමැත්තෙන්ම ඒ සඳහා ලියාපදිංචි වීමට හා ආපසු නොගෙවනු ලබන සියයට 5 ක එකතුකළ අගය මත බද්දක් ගෙවීමට අවස්ථාව ලබාදෙන ලදී.
- පහත සඳහන් අයිතමයන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
  - දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන අත්යන්ත්‍ර රෙදිපිළි සැපයුම
  - ලංකා විදුලි බල මණ්ඩලය ආනයනය කරනු ලබන යන්ත්‍ර හා උපකරණ
  - වලංගු මාර්ග බලපත්‍රයක් හිමි ඕනෑම බස් හිමියකු විසින් කරනු ලබන බස්රථ ආනයනය.
  - කර්මාන්ත ශාලා නවීකරණය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර ආනයනය (තේ කර්මාන්තය සඳහා යන්ත්‍රසූත්‍ර, ආහාර හා පානවර්ග සැකසීම හෝ නිෂ්පාදනය සඳහා යන්ත්‍රසූත්‍ර සහ පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රසූත්‍ර)
  - දැව් තෙල්
  - අභිජනන සතුන් හා ද්‍රව්‍යයන්
  - විදුලිබලය උත්පාදනය හා බෙදාහැරීම
  - නැව් කුලියට ගැනීම
  - ඕනෑම චිත්‍රපටයක් නිෂ්පාදනය, බෙදාහැරීම හා ප්‍රදර්ශනය කිරීම සහ චිත්‍රපටි නිෂ්පාදනය සඳහා චිත්‍රාගාර පහසුකම් සැපයීම.
- පහත සඳහන් අයිතමයන්ගේ එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී.
  - ඉහළ තාක්ෂණයකින් යුතු වෛද්‍ය උපකරණ
  - ප්‍රවේශ පත්‍ර නිකුත් කරන යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සඳහා යොදාගනු ලබන යන්ත්‍රසූත්‍ර
  - ජාතික චිත්‍රපට සංස්ථාවේ අනුමැතිය ඇතිව, චිත්‍රපට කර්මාන්තය සඳහා ආනයනය කරනු ලබන තෝරාගත් අයිතමයන්
  - ස්වර්ණාභරණ
- ඒකක භාර හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු මුද්දර බද්දෙන් නිදහස් කරන ලදී.
- උතුරු හා නැගෙනහිර පළාත්වල මත්පැන් හා සිගරට් සඳහා වන ව්‍යාපාර පිරිවැටුම් බදු ඉහළ දමන ලදී.

2007 ජනවාරි 02 - සමෘද්ධි අධිකාරිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් හර බද්දෙන් නිදහස් කරන ලදී.

2007 මාර්තු 13 - මත්පැන් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී.

2007 අප්‍රේල් 01 - ආර්ථික සේවා ගාස්තුව ගණනය කිරීම සඳහා අදාළ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් දශ ලක්ෂ 10 සිට රුපියල් දශ ලක්ෂ 7.5 දක්වා අඩු කරන ලදී.

- නිමැවුම් කර්මාන්තය හා සම්බන්ධ වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් එහි ක්‍රියාකාරකම් ආරම්භයේ සිට වසර 3 ක් දක්වා වෙළෙඳ හෝ ව්‍යාපාරික විකුණුම් සඳහා ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් කරන ලදී.
- එතෙර ගනුදෙනු සිදු කරන අන්තරාල වෙළෙඳාම් සඳහා පිරිවැටුම සහ වසා තබන ලද කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීම මත පිරිවැටුම (නැවත ආරම්භකර වසර 3 ක් සම්පූර්ණ වන තෙක්) ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කරන ලදී.
- ඒකක භාර මත සියයට 0.5 ක ආර්ථික සේවා ගාස්තුවක් පනවන ලදී.
- සේවා නියුක්තිකයන්ගේ සේවාන්ත ප්‍රතිලාභ සඳහා වන බදු තල පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.
    - සේවා දායකත්වය ලබා දී ඇති කාල සීමාව අවුරුදු 20 ට වඩා වැඩිවන විට පහත අනුපාත අදාළ වේ.
        - පළමු රුපියල් 5,000,000 - නැත
        - ඊළඟ රුපියල් 1,000,000 - සියයට 5
        - ඉතිරිය - සියයට 10
    - දායකත්වය ලබා දී ඇති කාල සීමාව අවුරුදු 20 ට අඩුවන විට පහත අනුපාත අදාළ වේ.
        - පළමු රුපියල් 2,000,000 - නැත
        - ඊළඟ රුපියල් 1,000,000 - සියයට 5
        - ඉතිරිය - සියයට 10
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදාගනු ලබන යන්ත්‍රසූත්‍ර සඳහා වන ක්ෂය ප්‍රතිභාගය සියයට 12.5 සිට සියයට 25 දක්වා වැඩි කරන ලදී.
- බැංකුවල හා අනෙකුත් මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මත තනි පුද්ගලයන් වෙනුවෙන් ඇති පොලී ආදායම් මත වන රඳවාගැනීමේ බදු සම්බන්ධයෙන් නව නීති අදාළ කරන ලදී. ඒ අනුව, ඕනෑම තක්සේරු වර්ෂයක් සඳහා තැන්පත්කරුවකුගේ ප්‍රකාශයට පත්කර ඇති මුළු ආදායම
    - රුපියල් 300,000 කට වඩා අඩුනම්: රඳවා තබාගැනීමේ බද්දක් අඩු කරනු නොලැබේ.
    - රුපියල් 300,000 ට වැඩි නමුත් රුපියල් 600,000 නොඉක්මවන්නේ නම්: සියයට 2 1/2 ක බද්දක් අඩු කරනු ඇත.
    - රුපියල් 600,000 කට වැඩි නම්: සියයට 10 ක බද්දක් අඩුකරනු ඇත.

| | | |
|---|---|---|
| | - | උපදේශක ගාස්තු සඳහා වන රඳවා තබා ගැනීමේ බද්ද සියයට 5 සිට සියයට 1 දක්වා අඩු කරන ලදී. |
| | - | ශ්‍රී ලංකාවෙන් පිටත ඉදිකිරීමේ කටයුතුවල නිරතවන ඕනෑම පුද්ගලයකුගේ ලාභ විදේශ මුදලින් ගෙවනු ලබන්නේ නම් හා බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් එහි ලාභය ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් ගාස්තුවේ පරිපාලන කටයුතු කිරීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට පවරන ලදී. |
| | - | නැව් සඳහා වන ප්‍රාග්ධන දීමනාව සියයට 33 1/3 දක්වා වැඩිකරන ලදී. |
| 2007 අප්‍රේල් | - | භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම් (TIERA) හර බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2007 මැයි 14 | - | තෝරාගත් ආනයන භාණ්ඩ සඳහා වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදුවලට අදාළව නිදහස් කිරීම් සහ සහන ලබාදීම් සිදුකරන ලදී. |
| 2007 ජූනි 01 | - | සිගරට්වල දිග පදනම් කරගෙන ඒ සඳහා වන නිෂ්පාදන බදු ඉහළ දමන ලදී. |
| 2007 ජූනි 06 | - | තෝරාගත් වර්ග කිහිපයක අළුත් මාළු, කඩල හා මුං ඇට ආනයනයේ දී අය කරන එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. |
| 2007 ජූලි 01 | - | ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹ ඇති සෞඛ්‍ය සේවාවන් සපයනු ලබන වෛද්‍ය ආයතන සහ මැටිවලින් නිපදවනු ලබන පිඟන් ගඩොල්, මෙතෙක් දේශීය වශයෙන් නිපදවනු ලබන සකස් නොකරන ලද එළවලු, පළතුරු සහ මාළු නිෂ්පාදන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | සංයුක්ත අංක 1401.20 යටතේ ආනයනය කරනු ලබන වේවැල් හෝ එසේ ආනයනය කරනු ලබන වේවැල් සැපයීම, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2007 ජූලි 17 | - | දේශීය වශයෙන් නිපදවනු ලබන රසායනික නැප්තා එකතුකළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | සංයුක්ත අංක 8411.91 සහ 8803.30 යටතේ වර්ගීකරණය කරනු ලබන ගුවන් යානා එන්ජින් සහ ගුවන් යානා අමතර කොටස් ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2007 සැප්තැම්බර් 24 | - | ජංගම දුරකථන ග්‍රාහක ගාස්තුව සියයට 2.5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී. |
| 2007 ඔක්තෝබර් 15 | - | රථ වාහන වල සිලින්ඩර ධාරිතාව අනුව විවිධ අනුපාතයන් අදාළ වන පරිදි ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද සංශෝධනය කරන ලදී. |
| 2007 ඔක්තෝබර් 25 | - | මත්පැන් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| 2007 නොවැම්බර් 07 | - | අත්‍යවශ්‍ය නොවන අයිතම ආනයනය සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| 2007 නොවැම්බර් 26 | - | තෝරාගත් ආනයනික අයිතමයන් මත වූ සෙස් බද්ද සංශෝධනය කරන ලද අතර, අළුතින් තෝරාගත් අයිතමයන් සඳහා සෙස් බදු පනවන ලදී. |
| 2008 ජනවාරි 01 | - | පෙට්‍රල් ආනයනය සඳහා වූ එකතු කළ අගය මත බදු සියයට 15 සිට සියයට 5 දක්වා අඩුකරන ලදී. |
| | - | ජංගම දුරකථන සඳහා පවතින සියයට 10 ක් වූ ග්‍රාහක ගාස්තුව රැහැන් රහිත දුරකථන සඳහා ද පනවන කරන ලදී. |
| | - | පහත සඳහන් දෑ එකතුකළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |

- සමුපකාර ග්‍රාමීය බැංකු වල මූල්‍ය සේවා
- 1972 අංක 05 දරණ සමුපකාර සංගම් නීතිය යටතේ ලියාපදිංචි සමුපකාර සංගමයක් මගින් සපයනු ලබන භාණ්ඩ හා සේවා
- *"නැගෙනහිර උදානය"* වැඩසටහන යටතේ බදු විරාම ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන ආයතන, ව්‍යාපාර අවශ්‍යතාවයන් සඳහා යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම.
- හඳුනාගත් විශේෂිත රජයේ ව්‍යාපෘතීන්
- ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන කිරිවලින් නිපදවනු ලබන කිරි නිෂ්පාදන
- ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන සහල් වලින් කරනු ලබන සහල් නිෂ්පාදන
- දේශීය වශයෙන් නිපදවනු ලබන සීනි
- ඇඟළුම් කර්මාන්ත සඳහා නූල් ආනයනය

- මුද්‍රා තැබූ කදම්භ ලාම්පු ඒකක, පාරජම්බුල හෝ අධෝරක්ත ලාම්පු ඇතුළු විදුලි පරිපථ චාප ලාම්පු කාබන් සඳහා වූ එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 5 දක්වා අඩුකරනු ලැබීය.
- කිසියම් ව්‍යාපාරයක පිරිවැටුම අපනයනය හෝ විදේශ විනිමය ඉපයීම් වලින් සමන්විත වන්නේ නම් ආර්ථික සේවා ගාස්තුව සියයට 2.5 කට සීමා කරනු ලැබීය.
- මත්පැන් සහ මෝටර් රථ අලෙවියෙන් ලැබෙන පිරිවැටුම සඳහා වූ ආර්ථික සේවා ගාස්තුව සියයට 0.5 සිට සියයට 1 දක්වා ඉහළ නංවන ලදී.
- සමාජීය වගකීම් ගාස්තුව සියයට 1 සිට සියයට 1.5 දක්වා ඉහළ නංවන ලදී.
- ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ගාස්තුව සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩිකරන ලදී.
- 2008 ජනවාරි 1 දිනට පසුව *"අපි වෙනුවෙන් අපි"* අරමුදල සඳහා කරනු ලබන පරිත්‍යාගයන් තක්සේරු ආදායම ගණනය කිරීමේදී සුදුසුකම් ලැබූ ගෙවීම් යටතේ සම්පූර්ණ අඩු කිරීමකට ඉඩදෙන ලදී.
- මැණික් වෙන්දේසියේදී අලෙවි කරනු ලබන මැණික් වල වටිනාකම මත සියයට 2.5 ක ආදායම් බද්දක් පනවනු ලැබීය.

**අපේක්ෂිත**

2008 අප්‍රේල් 01

- සමුපකාර සමිති වල (සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුළුව) ලාභය හෝ ආදායම අවුරුදු 5 කාලයක් සඳහා ආදායම් බදු වලින් නිදහස් කිරීම.
- සමුපකාර සමිති (සමුපකාර ග්‍රාමීය බැංකුද ඇතුළුව) විසින් බැංකු හෝ අනෙකුත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ඕනෑම තැන්පතුවක් සඳහා ලැබෙන පොලී ආදායම රඳවාගැනීමේ බද්දෙන් නිදහස් කිරීම.
- සමුපකාර සමිතියක් හෝ 1972 අංක 5 දරණ සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි වී ඇති ග්‍රාමීය බැංකුවක් මගින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ජංගම ගිණුම් හෝ ඉතුරුම් ගිණුම් හර බද්දෙන් නිදහස් කිරීම.
- රුපියල් දශ ලක්ෂ 50 කට වැඩි ආයෝජනයක් ඇති සහ පුද්ගලයින් 50 කට වැඩි රැකියා අවස්ථා සපයන නැගෙනහිර පළාතේ සිදුකරනු ලබන නව ආයෝජනයන් අවුරුදු 5 ක කාලයක් සඳහා ආදායම් බදු වලින් නිදහස් කිරීම.

- බැංකු ගිණුම් මත උපයනු ලබන පොලී ආදායම ඇතුළුව, *"අපි වෙනුවෙන් අපි"* අරමුදලෙහි ඕනෑම ලාභයක් හෝ ආදායමක් ආදායම් බද්දෙන්, ඕනෑම තැන්පතුවකට අදාළ රඳවා තබා ගැනීමේ බද්දෙන් හා හර බද්දෙන් නිදහස් කිරීම.

- ආනයනය කරනු ලබන මූලික මැණික් කපා ඔප දමා අපනයනය කිරීමෙන් ලබාගන්නා ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

- මත්පැන් සහ මෝටර් රථ වාහන විකිණීමේදී අදාළ වන ආර්ථික සේවා ගාස්තුව සියයට 0.5 සිට සියයට 1 දක්වා වැඩි කිරීම.

- බදු විරාම ලබාදීමේදී පහත සඳහන් වෙනස් කිරීම් සිදුකරනු ඇත.

  - ආයෝජන මණ්ඩල නීතිය හෝ දේශීය ආදායම් පනත යටතේ හෝ දැනටමත් ප්‍රදානය කර ඇති බදු විරාමයන්, එහි කාලය ඉකුත් වීමෙන් පසු තවදුරටත් දීර්ඝ නො කෙරෙනු ඇත.

  - ආයෝජන මණ්ඩල නීතිය දේශීය ආදායම් පනත යටතේ 2008 අප්‍රේල් 01 දිනට පසු ආරම්භ වන බදු විරාමයන් උපරිම වශයෙන් අවුරුදු තුනකට වඩා වැඩි නොවනු ඇත. බදු විරාම කාලය ඉකුත් වීමෙන් පසුව උපයනු ලබන ලාභ සහ ආදායම් වලින් පහත සඳහන් පරිදි බදු අය කෙරෙනු ඇත.

    i. පළමු වසර, සියයට 5 බැගින්
    ii. දෙවන වසර, සියයට 10 බැගින් සහ
    iii. තුන්වන වසර, සියයට 15 බැගින්

  - ආයෝජන මණ්ඩල නීතිය හෝ දේශීය ආදායම් පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ලබා දෙන අවුරුදු පහක බදු විරාම කාලය නොවෙනස්ව පවතිනු ඇත.

  - බදු විරාම ලබාදී ඇති ජාතික වශයෙන් වැදගත්කමක් ඇතැයි හඳුනාගෙන ඇති විශේෂිත ව්‍යාපෘති සඳහා මෙම සීමාවන් අදාළ නොවනු ඇත.

  - ඕනෑම පනතක් යටතේ බදු විරාමයක් ප්‍රදානය කිරීමට පෙර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම.

  - බදු විරාමයන් ලැබූ පුද්ගලයින්ගේ නාම ලේඛනයක් වසර අවසානයේදී ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ඇත.

- ආදායම් බදු සඳහා පහත සඳහන් වෙනස්කිරීම් සිදුකරනු ඇත.

  - පහත සඳහන් විදේශීය ඉපයීම් වලින් ලබන ලාභය හෝ ආදායම බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට එවනු ලබන්නේ නම් ඒවා ආදායම් බදු වලින් නිදහස් කෙරෙනු ඇත.

    - කිසියම් පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාවෙන් පිටත දී කරනු ලබන සේවාවන් වෙනුවෙන් ගෙවනු ලබන වැටුප්, දීමනා හෝ ගාස්තු

    - ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකර ඇති ආයෝජන සඳහා වන ලාභාංශ සහ පොලී ආදායම

  - නාගරික ප්‍රදේශයන්හි පැල්පත් වාසීන්ගේ නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතීන්හි කරනු ලබන ආයෝජන සුදුසුකම් ලැබූ ගෙවීමක් ලෙස සීමාවකින් තොරව තක්සේරු ආදායමෙන් අඩුකිරීම සඳහා ඉඩදීම.

  - සමාගම් බදු මත අයකරනු ලබන සමාජීය වගකීම් ගාස්තුව ඉදිරියටත් අයකරනු ලබන අතර පුද්ගල ආදායම් බදු මත අය නොකිරීම.

| | | |
|---|---|---|
| | - | රාජ්‍ය මැණික් සංස්ථාවේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබන මැණික් වෙන්දේසි කිරීමේ ආදායම් සඳහා සියයට 2.5 ක ආදායම් බද්දක් පමණක් අයකිරීම. |

**රජයේ වියදම**

| | | |
|---|---|---|
| 2007 ජූනි 15 | - | පවතින පොලී අනුපාතිකයන් පිළිබිඹුවන ලෙස රජයේ සේවකයන් සඳහා ලබා දෙන නිවාස හා දේපළ ණය සම්බන්ධ පොලී අනුපාත සංශෝධනය කරන ලදී. |
| 2007 අගෝස්තු | - | ඉන්ධන සහනාධාරය ඉවත් කිරීම නිසා ඇතිවන ආර්ථිකමය බලපෑම සමනය කිරීම සඳහා සෑම ධීවර බෝට්ටු හිමියකු සඳහාම රුපියල් 4,000 ක මුදලක් මසක කාලයක් සඳහා ලබා දෙන ලදී. |
| 2007 සැප්තැම්බර් | - | විදුලිබල පහසුකම් රහිත සමෘද්ධි හිමිකම්ලාභීන්ට මසකට රුපියල් 100 ක භූමිතෙල් සහනාධාරයක් ලබාදීම රජය විසින් ආරම්භ කරන ලදී. |

**ණය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 19 | - | විදේශීය ආයෝජකයන් සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් වන නීතිමය අවශ්‍යතාවයන් සංශෝධනය කරන ලදී. |
| 2007 පෙබරවාරි 02 | - | අඩු වටිනාකම් ඇති එක් දින ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වාර්තා කිරීම සඳහා මහ බැංකුව පුළුල් පැතුරුම් ජාල ක්‍රමය පදනම් කරගත් ගනුදෙනු සටහන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. |
| 2007 අගෝස්තු 01 | - | භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම සඳහා සිල්ලර අලෙවි කුටි විවෘත කරන ලදී. |
| 2007 ඔක්තෝබර් 24 | - | එ. ජ. ඩොලර් දශ ලක්ෂ 500 වටිනාකමින් යුතු ප්‍රථම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කරන ලදී. |
| 2007 ඔක්තෝබර් | - | ගණුදෙනුකරුවන්ගේ රුපියල් දශ ලක්ෂ 5 ක හෝ ඊට අඩු වටිනාකමකින් යුත් ප්‍රතිමිලදී ගැනීම් ප්‍රතිස්ථානගත කිරීමේ ගණුදෙනු හෝ ගණුදෙනුකරුට හිමිකම පවරාදීම මත සිදුවන ප්‍රතිස්ථානගත කිරීමේ ගණුදෙනු වාර්තා කිරීමට හැකිවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකු පුළුල් පැතුරුම් ජාල ක්‍රමය මත ගණුදෙනු සටහන් කිරීමේ ක්‍රමය සංශෝධනය කරන ලදී. |
| 2007 දෙසැම්බර් 03 | - | රුපියල් වටිනාකමින් යුතු භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමට විදේශිකයනට ලබාදුන් උපරිම සීමාව නොපියවා ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකමින් සියයට 5 සිට සියයට 10 දක්වා වැඩිකරන ලදී. |
| 2007 දෙසැම්බර් 14 | - | භාණ්ඩාගාර බිල්පත් සීමාව රුපියල් බිලියන 300 සිට රුපියල් බිලියන 375 දක්වා වැඩිකිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගන්නා ලදී. |

**මූල්‍ය අංශය**

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 01 | - | 2007 අංක 1 දරණ මූල්‍ය සමාගම් (ණයදීම්) විධානය නිකුත් කරන ලදී. |
| | - | මහ බැංකු ඇස්තමේන්තුවලට අනුව බැංකු ක්‍රමය තුළ ද්‍රවශීලතා අතිරික්තයක් පවතින දිනවලදී ප්‍රතිවිකුණුම් පහසුකම් ලබා නොදීමට තීරණය කරන ලදී. |
| 2007 ජනවාරි 02 | - | "2007 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" ශ්‍රී ලංකා මහ බැංකු විසින් ප්‍රකාශයට පත්කරන ලදී. |
| 2007 ජනවාරි 11 | - | යම්කිසි බැංකුවකට ප්‍රතිවිකුණුම් පහසුකම් ලබාදීම 2007 මාර්තු 31 දක්වා කැලැන්ඩර් මාසයක් සඳහා හය වරකට පමණක් සීමා කරන ලදී. ඉන් පසුව, මහ බැංකු ඇස්තමේන්තුවලට අනුව බැංකු ක්‍රමය තුළ ද්‍රවශීලතා හිඟයක් පවතින්නේ නම් පමණක් කැලැන්ඩර් මාසයක දී තුන් වරක් දක්වා ප්‍රතිවිකුණුම් පහසුකම ලබාදෙන ලදී. |

| | | |
|---|---|---|
| 2007 ජනවාරි 19 | - | බැංකුවල කොටස් හිමිකාරිත්වය සම්බන්ධයෙන් නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස බලය ලත් බලපත්‍රලාභී බැංකු වෙත බැංකු පනත යටතේ නව විධානයන් නිකුත් කරන ලදී. |
| | - | ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනුවල යෙදෙන ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සුපරික්ෂාකාරී ලෙස කටයුතු පවත්වාගෙන යාමට සහ අදාළ නීති යටතේ ඕනෑම සැක කටයුතු ගනුදෙනු පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කිරීම බැංකුවල අවශ්‍යතාවයක් බවට පත්කරන ලදී. |
| 2007 පෙබරවාරි 13 | - | මූල්‍ය අංශයේ නියාමන ආයතන අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීමේ අරමුණින් අන්තර් නියාමන ආයතන සභාවක් පිහිටුවන ලදී. |
| 2007 පෙබරවාරි 14 | - | ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) කටයුතු පුළුල් කිරීම හා නවීකරණය කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශ පනතට අදාළ සංශෝධන යෝජනා කරනු ලැබිණි. |
| 2007 පෙබරවාරි 20 | - | බලපත්‍රලාභී බැංකුවක් විසින් තනි පුද්ගලයෙකුට හෝ ගනුදෙනුකරුවන් කණ්ඩායමකට ලබාදිය හැකි උපරිම ණය පහසුකම් ප්‍රමාණය සම්බන්ධ විචක්ෂණශීලී අවශ්‍යතාවයන් සඳහා බැංකු පනත යටතේ නව විධානයන් නිකුත් කරන ලදී. |
| 2007 පෙබරවාරි 23 | - | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 10.50 සහ සියයට 12.00 දක්වා පදනම් අංක 50 කින් ඉහළ දමන ලදී. |
| 2007 පෙබරවාරි 28 | - | විශේෂිත කොන්දේසි වලට යටත්ව සුරැකුම් රහිත ණයකර වල මුහුණත වටිනාකම ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ප්‍රාග්ධන අරමුදල් වලට ඇතුළත්වීමට හැකිවන පරිදි නිශ්චය කිරීමක් මූල්‍ය සමාගම්වලට ලබාදෙන ලදී. |
| | - | 1995 අංක 1 දරණ මූල්‍ය සමාගම් (ආදායම් හඳුනාගැනීම සහ මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කිරීම්) විධානය අහෝසි කරන ලදී. |
| 2007 මාර්තු 27 | - | තෝරාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී පවත්වා ගතයුතු වූ සියයට 50 ආන්තික තැන්පත් අවශ්‍යතාවය ඉවත් කරන ලදී. |
| 2007 අප්‍රේල් 26 | - | 2007 අංක 1 දරණ මුදල් සමාගම් (බාල වයස්කරුවන් සඳහා ඉතිරිකිරීම් ගිණුම් පවත්වාගෙන යාම) උපදෙස් මාලාව නිකුත් කරන ලදී. මෙම උපදෙස් මාලාව මගින් සෑම ලියාපදිංචි මුදල් සමාගමක් විසින්ම බාල වයස්කරුවන් සඳහා පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමක ඇති ශේෂය මාස 60 ක කාලයකට පසුව, දෙමව්පියන්ගේ හෝ නිත්‍යානුකූල භාරකරුවෙකුගේ උපදෙස් සහිතව තැන්පතු භාරගැනීම සඳහා බලයලත් මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන වෙනත් ගිණුමක මාරුකළ යුතු බවට වූ වගන්තියක් ඇතුළත් කිරීම අවශ්‍ය කෙරේ. එමෙන්ම, බාල වයස්කරුවන්ගේ ගිණුම් වලින් මුදල් ආපසු ලබාගතහැකි අවස්ථාවන් ද මෙමගින් නිශ්චය කර ඇත. |
| 2007 මැයි 23 | - | පරිණත කාලයක් රහිත ණය උපකරණ, යම් විශේෂිත කොන්දේසිවලට යටත්ව මූලික ප්‍රාග්ධනයේ කොටසක් ලෙස ඇතුළත් කිරීමට අනුමැතිය සඳහාත්, දෙමුහුන් (ණය/හිමිකරු ප්‍රාග්ධන ලක්ෂණ ඇති උපකරණ) ප්‍රාග්ධන උපකරණ හා කණිෂ්ඨ ණය උපකරණ අදාළ සුදුසුකම් නිර්ණායකයන් පුළුල් කිරීම සඳහාත් වූ නව විධානයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2007 ජූනි 19 | - | බාසල් II ට අදාළ විධානයන් බැංකුවලට නිකුත් කිරීමට පෙර බාසල් II නව ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳව වූ උපදේශක පත්‍රිකාව, බැංකුවල අදහස් ලබාගැනීම සඳහා නිකුත් කරන ලදී. |
| 2007 ජූනි 27 | - | ගෙවීම් සහ පියවීම් ක්‍රම පනතට අනුව 2007 අංක 01 දරණ මුදල් ගෙවීම් නිශ්කාෂණ හා පියවීමේ සේවා සපයන්නන්ගේ විධිවිධානයන් නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2007 ජූනි 29 | - | 2007 අංක 22 දරණ මූල්‍ය සමාගම් (අධ්‍යක්ෂවරුන් සහ ඔවුනගේ ඥාතීන් සමග ව්‍යාපාරික ගනුදෙනු) විධානය නිකුත් කරන ලදී. |
| | - | 2006 අංක 5 දරණ මූල්‍ය සමාගම් (ණය දීම්) විධානය අවලංගු කරමින් ඒ වෙනුවට 2007 අංක 1 දරණ මූල්‍ය සමාගම් (ණය දීම්) විධානය නිකුත් කරන ලදී. |
| 2007 ජූලි 25 | - | ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් 32 හා 39 සම්බන්ධයෙන් වූ සාකච්ඡා පත්‍රිකාවක් බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2007 අගෝස්තු 01 | - | ප්‍රමුඛ ඉතිරි කිරීම් හා සංවර්ධන බැංකුවේ වත්කම් හා වගකීම් "සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව" නම් වූ නව රාජ්‍ය බැංකුවට පවරන ලදී. |
| 2007 අගෝස්තු 23 | - | ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළෙඳපොළ කටයුතු තුළ සහභාගිත්ව ආයතන වශයෙන් ප්‍රාථමික වෙළෙඳුන් නැවත ඇතුළත් කරගන්නා ලදී. |
| | - | ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යටතේ, ප්‍රතිවිකුණුම් පහසුකම් මගින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් සඳහා ලබාදිය හැකි මුදල් ප්‍රමාණය ප්‍රකාශයට පත්කිරීමට හා ලබාදෙන මුදල් ප්‍රමාණය අනුපාත පදනමක් මත ලබාදීමට තීරණය කරන ලදී. |
| 2007 නොවැම්බර් 01 | - | බලපත්‍රලාභී බැංකු විසින් තනි ගනුදෙනු කරුවෙකුට හෝ ගනුදෙනුකරුවන් සමූහයකට දෙනු ලැබිය හැකි උපරිම ණය පහසුකම් ප්‍රමාණයට අදාළ සීමාවන් සංශෝධනය කරන ලදී. |
| 2007 නොවැම්බර් 14 | - | ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතිය යටතේ, සහභාගිත්ව ආයතන සේවා විධානයන් හා ගනුදෙනුකරුවන්ගෙන් චෙක්පත් තැන්පතු භාරගැනීම හා ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වලට චෙක්පත් වටිනාකම් බැරකිරීම සඳහා නියමිත කාලසීමාවන් සඳහා පොදු විධානයන් මහ බැංකුව මගින් නිකුත් කරන ලදී. |
| 2007 නොවැම්බර් 21 | - | යම්කිසි බැංකුවකට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් අනුපාතය යටතේ කැලැන්ඩර් මාසයක් සඳහා ප්‍රතිවිකුණුම් පහසුකම් ලබාදීම 2007 දෙසැම්බර් 3 සිට සීමා කරන ලදී. එමෙන්ම එකී බැංකුව කැලැන්ඩර් මාසයක් තුළ හතර වරකට වඩා වැඩියෙන් මෙම පහසුකම ලබාගන්නේ නම් එය සියයට 19 ක් වූ වාර්ෂික දඩ පොලී අනුපාතයක් යටතේ ලබාගැනීමට අවසර දෙන ලදී. |
| 2007 දෙසැම්බර් 26 | - | බාසල් II යටතේ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය පවත්වාගෙන යාම පිළිබඳ විධානයන් නිකුත් කරන ලදී. ඒ අනුව, 2008 ජනවාරි 01 දින සිට බැංකු විසින් ප්‍රාග්ධන අනුපාතය ගණනය කිරීමේදී ණය අවදානම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශයද, වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රමිතිගත මිණුම් ප්‍රවේශයද, මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශයද භාවිතා කළයුතු වේ. |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝග්‍යතාව සහ හිමිකාරත්වය ඇගැයීම සඳහා වන නිර්ණායකයන් ආදිය ආවරණය වන ආයතනික යහපාලනයට අදාල විධානයන් නිකුත් කරන ලද අතර මෙය 2008 ජනවාරි 01 දින සිට බලපැවැත්වේ. |
| 2007 දෙසැම්බර් 31 | - | විදේශීය බැංකුවල බැංකු කටයුතු ප්‍රසාරණය වීම, නව මූල්‍ය සේවාවන් හඳුන්වාදීමේ අවශ්‍යතාවය හා දියුණු අවදානම් කළමනාකරණ පරිචයක් වැනි අංශ පිළිබඳ විශේෂඥතාවය අවශ්‍යවීම යනාදි කරුණු සැලකිල්ලට ගෙන බැංකු ක්ෂේත්‍රයේ විදේශිකයන්ගේ සේවය ලබාගැනීම පිළිබඳ නව ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. |
| 2008 ජනවාරි 02 | - | "2008 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙරදැක්ම" ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලදී. |
| 2008 මාර්තු 10 | - | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව එහි කටයුතු ආරම්භ කරන ලදී. |

**අපේක්ෂිත**

- බැංකුවල අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- කෘෂිකාර්මික අංශය සඳහා ණය ලබාදීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සම්බන්ධ විධානයන් නිකුත් කිරීම.
- 2008 ජූනි මාසයේ සිට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් 32 සහ 39 ට අනුකූලව සමාන්තරව වාර්තා කිරීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කිරීම.
- බාහිර පාර්ශ්වයන්ට පවරා දී ඇති කාර්යයන් කළමනාකරණයේදී බල පැවැත්වෙන විචක්ෂණ නියාමනයන් නිකුත් කිරීම.